ජා-ඇල ප්‍රාදේශීය සභාව - 2023

---------------------------------

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ජා-ඇල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ජා-ඇල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ

ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිතියේ අංක 3.28 ප්‍රකාරව හා එහි පරිශිෂ්ඨය 2හි පහදාදීම් හා මඟපෙන්වීම් හි EG 6.2 ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී අතිරික්තයට ගලපා තිබූ රු.180,879,410 ක් වූ වටිනාකම කුමක්ද යන්න විගණනයට අනාවරණය කර ගැනීමට නොහැකි විය. තවද ජංගම නොවන වත්කම්වල වෙනස රු.28,764,219ක් ද අතිරික්තයට ගලපා තිබූ අතර තොගවල අඩුවීම රු.23,535,433ක් ද කෙටිකාලීනව ගෙවිය යුතු දෑවල වෙනස රු.14.734,865ක් ද අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගන්නා බව. | යොමුගත ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රමිතියේ අංක 3.29 හා එහි පරිශිෂ්ඨය 2හි පහදාදීම් හා මඟපෙන්වීම් හි EG 6.3 ප්‍රකාරව ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලත් මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේ රු.50,000,000ක් වූ ස්ථාවර තැන්පතුවල අයෝජනය හා රු.20,551,782ක් වූ ස්ථාවර තැන්පතු නිදහස් කර ගැනීම් සැලකිල්ලට ගෙන නොතිබුණි. | -එම- | -එම- |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී යන්ත්‍ර යටතේ ප්‍රාග්ධනීත කරන ලද රු.165,100ක් වියදමට ගලපා තිබීම නිවැරදි කිරීමේදී නැවත වියදමට හා යන්ත්‍ර ගිණුමට ද ගලපා තිබුණු හෙයින් එම ප්‍රමාණයෙන් වියදම වැඩියෙන් ද යන්ත්‍ර වටිනාකම අඩුවෙන් ද දක්වා තිබුණි. | පිළිගන්න බව | වැරදි නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විස්තීර්ණ ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.42,375,739ක් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දක්වනු වෙනුවට 2020 වර්ෂයේ ලැබී තිබුණු නමුත් ගිණුම් ගතකර නොතිබුණු රු.103,452,469ක් වූ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ද ඇතුළත්ව රු.145,828,208ක් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දක්වා තිබුණි. | රු.103,452,469 ක් 2023.12.31 දින අවසන් ගිණුමේ නිවැරදි කර ඇති බව හා එබැවින් මුළු මුදල රු.145,828,208 ක් බව. | -එම- |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කළ උපලේඛනවල හා මූල්‍ය ප්‍රකාශවල ගිණුම් 2ක ශේෂයන් අතර රු. 10,466,481ක නොසැසඳුණු වෙනසක් පැවතුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනසට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂයත් එදිනට පිළියෙල කළ බැංකු සැසඳුමෙහි නිවැරදි කර ගත යුතු මුදල් ශේෂයත් අතර රු.1,268,062ක නොසැසඳීමක් නිරීක්ෂණය වුවද ඒ සම්බන්ධයෙන් හඳුනාගැනීමක් සිදුකර නොතිබුණි. | මෙම ශේෂය කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | ගම්පහ පෞද්ගලික බස් සමාගම | 31,690 | උපලේඛන කාල විශ්ලේෂණ | අදාල ලේඛන නිවැරදි කර ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත යවා ඇති බව. | අදාළ උපලේඛනය ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය |
| (ii) | වත්කම් විකිණීමේ ගිණුම | 3,138,130 | -එම- | -එම- | -එම- |
| (iii) | සභාපතිගේ නිල රථය | 10,403 | -එම- | -එම- | -එම- |
| (iv) | දඩ මුදල් ගිණුම | 27,282 | -එම- | -එම- | -එම- |
| (v) | හිඟ විදුලි ගාස්තු ගිණුම | 2,193,449 | -එම- | -එම- | -එම- |
| (vi) | සේවක ඇප ගිණුම | 15,000 | -එම- | -එම- | -එම- |
| (vii) | ලැබිය යුතු කර්මාන්ත බදු | 29,015 | -එම- | -එම- | -එම- |
| (viii) | වෙනත් හිඟ ආදායම් | 857,787 | -එම- | -එම- | -එම- |
| (ix) | පෙරගෙවුම් | 944,932 | උපලේඛන | -එම- | -එම- |
| (x) | අවිනිශ්චිත ගිණුම | 236,425 | -එම- | -එම- | -එම- |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ VII වන පරිච්ඡේදයේ 38(2) වගන්තිය | මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන බවටත් එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳ කලින් කළ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය | මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර එය විධිමත් කර ගැනීමට අවශ්‍ය වෙනස්කම් ද සිදුකර ඇත.ඒ සම්බන්ධව | යොමුගත පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| වෙනස්කම් සිදුකර ඇති බවටත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරි විසින් ඉටුකළ යුතු ලිඛිත සමාලෝචනයේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අදාල වාර්තා ඔබගේ අවධානයට ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු. 108,925,589ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු. රු. 22,041,963ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' |
| වරිපනම් හා බදු | 56,892 | 67,148 | 81,695 | 31,024 | 54,643 | 57,370 | 61,263 | 32,925 |
| කුලී | 23,174 | 22,944 | 20,468 | 38,671 | 28,130 | 22,137 | 11,299 | 36,195 |
| බලපත්‍ර ගාස්තු | 1,067 | 1,748 | 1,748 | - | 1,324 | 1,324 | 1,324 | - |
| වෙනත් ආදායම් | 730 | 200 | 163 | 50 | 780 | 50 | 38 | 13 |
| | 81,863 | 92,040 | 104,074 | 69,745 | 84,877 | 80,881 | 73,924 | 69,133 |

2.2.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මුලු ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 112 ක් බිල් කර තිබුණු හෙයින් හා මුලු ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 127ක් රැස් කර තිබුණු හෙයින් මුලු ආදායම ඇස්තමේන්තු කිරීම තාත්වික නොවීය. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට හැකි බව. | නිවැරදිව ආදායම් තක්සේරු කිරීම හා බිල් කිරීම කළ යුතුය. |
| (ආ) | කඳාන සාප්පු සංකීර්ණයේ නියමිත ලෙස ගෙවීම් කර නොතිබුණු කඩ කාමර 32 ක මාස 03 ක සිට මාස 47 ක්වූ කාල පරාසයක් හිඟව පැවති කුලී එකතුව රු,2,049,135ක් ක් අයකර ගෙන නොතිබුණි. | ඉතිරි මුදල අයකරගැනීමට අදාල කටයුතු සිදුකරමින් පවතින බව. | හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | රාගම පොදු වෙළඳපල සංකීර්ණයෙහි කඩ කාමර 14 ක අයකර ගැනීමට පැවති මාස 2 ක සිට මාස 39 දක්වා වූ රු. 3,947,680ක හිඟ කඩ කාමර කුලි අයකර ගැනීමට හෝ එම කඩ කාමර නැවත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර කඩ කාමර 49ක මාස 3 සිට මාස 39 දක්වා වූ හිඟ මුදල් රු. 13,324,216ක් අයකර ගෙන නොතිබුණි. | කඩකුලී නොගෙවන බදුකරුවන් 35 දෙනෙකු සඳහා එන්තරවාසි යැවීමට යොමුකර ඇති බව හා අනෙකුත් කඩහිමියන් හිඟ කොටස් වශයෙන් ගෙවීම සිදුකරනු ලබන බව. | -එම- |
| (ඈ) | 2023 වර්ෂය වෙනුවෙන් කර්මාන්ත බද්ද හා වෙළඳ ව්‍යාපාර බද්ද යටතේ දේපල පිළිබඳව සිදුකරන ලද සමීක්ෂණය අනුව ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති 296 හා රීති 297 ප්‍රකාරව වූ තොරතුරු ඇතුලත් කර සමීක්ෂණ වාර්තා පිළියෙල කර නොතිබුණි. | 2024 වසරේ බලපත්‍ර සමීක්ෂණයට එම තොරතුරු ඇතුලත් කිරීමට කටයුතු කරන බව. | රීති ප්‍රකාරව සමීක්ෂණ වාර්තා පිළියෙල කළ යුතුය. |
| (ඉ) | රාගම, නිවන්දම හා අදාල බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර තිබූ ප්‍රචාරක දැන්වීම් පිළිබඳව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | 2024 වසරේදී ප්‍රචාරක දැන්වීම් ගාස්තු වාර්තාවට ඇතුලත් කිරීමට කටයුතු කරන බව. | සමීක්ෂණ වාර්තා පිළියෙල කළ යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | දඹුගම උපකාර්යාලය විසින් කායවර්ධන මධ්‍යස්ථානයේ සාමාජිකත්වයෙන් ගාස්තු අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සකස් කර නොතිබුණි. | ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරන බව. | අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දඹුගම උප කාර්යාලය විසින් 2023 ඔක්තෝබර් 31 දින දක්වා එකතුව රු.1,705,450ක කසල බදු ආදායමක් ලබාගෙන තිබුණ ද බල ප්‍රදේශය තුල ව්‍යාපාර කටයුතු කරනු ලබන සියළුම ආයතන පිළිබඳව සමීක්ෂණයක් සිදු කර කසල එකතු කිරීම සඳහා අදාල ආයතන සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | 2024 වර්ෂයේදී සමීක්ෂණයක් මඟින් හඳුනාගෙන කසල බදු පැනවීමට අවශ්‍ය කටයුතු කරන බව. | ව්‍යාපාර කටයුතු කරනු ලබන සියළුම ආයතන පිළිබඳව සමීක්ෂණයක් සිදු කර කසල එකතු කිරීම සඳහා අදාල ආයතන සමඟ ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2018 හා 2019 වර්ෂවල සිට ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතුව පැවති රු.716,231ක් අයකරගෙන නොතිබුණි. | පිළිගනිමි. | අයවිය යුතු ලැබීම් සියල්ල අයකරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරන ගැසට් නිවේදනයේ "ඇ" කොටස අනුව 2023 වර්ෂය සඳහා පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන සඳහා සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර පරිසර බලපත්‍රයේ වලංගු කාලය අවසන් වීමෙන් පසු නැවත පරිසර බලපත්‍ර ලබාදීමට කටයුතු කර නොතිබුණු ආයතන 92ක් විය. | 2024 වසරට අදාල සමීක්ෂණය සඳහා මෙම ආයතන හඳුනාගැනීම සිදුකරන බව. | පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන සඳහා සමීක්ෂණයක් සිදුකර ආයතන හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාගම පිහිටි රථගාල බදු දීම සඳහා රු. 702,000ක් වූ අවම ටෙන්ඩර් මුදලට ගිවිසුම්ගත වන ලෙස ලංසුකරු වෙත දැනුම් දුන්නද පසුව නැවත රු. 200,000ක වාර්ෂික මුදලකට ලංසුකරු සමඟ ගිවිසුම්ගතවී තිබුණු හෙයින් අවම ලංසු මුදල හා සැසඳීමේදී රු. 502,000ක් අහිමි වී තිබුණි. | අවම ලංසු මුදලට ආසන්න වටිනාකමක් හෝ ලැබී නොතිබුණු බව. | රජයේ තක්සේරුවක් මත පදනම්ව එම තක්සේරු වටිනාකමට බදුදීම සිදු කළ යුතුය. |
| (ආ) | 2019 වර්ෂය සඳහා රාගම සති පොළ බදු දීම වෙනුවෙන් ටෙන්ඩර් කැඳවීමක් සිදු කිරීමකින් තොරව සභා තීරණයක් මත පැරණි බදුකරු වෙතම එම දේපළ බදු පදනමට ලබා දී තිබුණ ද ගිවිසුමකට එළඹ ගැනීමක් සිදු කර නොතිබුණු අතර 2019 වර්ෂය දක්වා එම බදුකරුගෙන් අයකර ගැනීමට පැවති රු. 3,902,730ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | බදු කුලී හිලව් කර දෙන ලෙස හා තක්සේරු වටිනාකම් අඩුකර දෙන ලෙස ඉල්ලීම් කර ඇති බව. | හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 වර්ෂයේ ටෙන්ඩර්කරුවන්ම ගිවිසුම්ගතවීමකින් තොරව පවත්වාගෙන යන රාගම මස්කඩ 02ක සහ කඳාන මස් කඩය 2023 අගෝස්තු 08 දිනෙන් පසුව මුද්‍රා තැබීමට තීරණය කර තිබුණද එසේ කිරීමට අපොහොසත් වී තිබුණි. | මහ සභා අනුමැතිය මත සියළුම මස්කඩ ටෙන්ඩර් පත්‍රිකා අවලංගු කරන ලද බව. | ගිවිසුම් නොමැති මස්කඩ සභාවේ භාරයට ගෙන නැවත ටෙන්ඩර් ලබා දී ගිවිසුම් ගත විය යුතුය. |
| (ඈ) | ටෙන්ඩර් ලබාදුන් දේපළ 5කට අදාලව 2023 වර්ෂය සඳහා රු. 2,128,375ක් ද සභාව සතු මස් කඩ තුනෙහි පෙර වර්ෂවලට අදාලව රු. 2,777,437ක් ද හිඟ මුදල් අයකර ගෙන නොතිබුණි. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට යොමුකර ඇති බව. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2(ආ) හා (ඇ), 2.4.1, 2.6.1(අ)(ii), 2.11.1(ආ), 2.12(අ), 2.14.1 , 4.2.2(ආ), 5.6.1(අ) හා (ඇ) යන මාර්ගෝපදේශ හා ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 7.11.1ට පටහැනිව සී.සී.ටී.වී. කැමරා පද්ධතියක් සවිකිරීම වෙනුවෙන් රු.2,071,090ක් ගෙවා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 වර්ෂය තුලදී වටිනාකම රු.54,736,687ක් වූ ව්‍යාපෘති 18ක් ආරම්භ කර තිබූ අතර එම ව්‍යාපෘතිවලට අදාල ගිවිසුම්වල කොන්දේසි අංක 3 යටතේ ව්‍යාපෘති කාලය දක්වා නොතිබීම නිසා එක් එක් ව්‍යාපෘතිය අදාල කාලය තුලදී ඉටුකර තිබුණේද යන්න තහවුරු කර ගැනීමට නොහැකි විය. | එවැනි අවස්ථාවන් මින් ඉදිරියේදී නිවැරදිව සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව. | කොන්දේසි නිවැරදිව ඇතුලත් කළ යුතුය. |

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 දෙසැම්බර් 31 දිනට සභාවේ කාර්යමණ්ඩල විස්තර අනුව වර්ෂ 05 ත් 10 ත් අතර කාල පරාසයක සිට තනතුරු 11 කට අදාළව කාර්යය මණ්ඩලයේ 31 දෙනෙකුගේ පුරප්පාඩුවක් විය. | තවමත් මෙම පුරප්පාඩු සහිතව සභාවේ කටයුතු සිදුකරගෙන යනු ලබයි. දෛනික රාජකාරී වල කාර්යක්ෂමතාවයට හානියක් නොවන පරිදි සේවයේ නියුක්ත නිලධාරීන් හා සේවකයින් මගින් එම රාජකාරී ආවරණය කරගෙන යාම සිදුකරන බව දන්වමි. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුය. |